# ලකුණුදීමේ පටිපාටිය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2023(2024)

## 74 පාලි

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

---

### ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

1 පත්‍රය - කාලය: පැය 02 යි.

මෙම ප්‍රශ්න පත්‍රය වරණ 04 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

2 පත්‍රය - කාලය: පැය 03 යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 03 කින් සමන්විත ය.

1 කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න 02 කින් සමන්විත ය.

| | | |
|---|---|---|
| 1 ප්‍රශ්නය : | (I) පාලියෙන් සිංහලට පරිවර්තනය | (ලකුණු 10) |
| | (II) පාලියෙන් සිංහලට පරිවර්තනය | (ලකුණු 10) |
| 2 ප්‍රශ්නය : | (I) පාලියෙන් සිංහලට පරිවර්තනය | (ලකුණු 10) |
| | (II) සිංහලෙන් පාලියට පරිවර්තනය | (ලකුණු 10) |

2 කොටස

ප්‍රශ්න තුනකින් සමන්විත ය. ප්‍රශ්න එකක් හෝ තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ය.

3 ප්‍රශ්නය

(I) අවබෝධය පරීක්ෂා කරන ප්‍රශ්නයකි. දෙනු ලබන ඡේදයක් ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.

(ලකුණු 10)

(II) වාක්‍යය රචනය හා නිර්මාණය පිළිබඳ පරීක්ෂා කරන ප්‍රශ්නයකි. වාක්‍යවල වැරදි නිවැරදි කොට නැවත ලියා දැක්විය යුතු ය.

4 ප්‍රශ්නය : සාහිත්‍ය හා සාහිත්‍ය ඉතිහාසය කොටස් හතරකින් යුතු ව්‍යුහගත රචනා ප්‍රශ්නයකි.

(ලකුණු 20)

5 ප්‍රශ්නය : සාහිත්‍ය විචාරය, රසාස්වාදය හා හරධර්ම වරිතායනය පිළිබඳ කොටස් හතරකින් යුතු ව්‍යුහගත රචනා ප්‍රශ්නයකි.

(ලකුණු 20)

3 කොටස

6 ප්‍රශ්නය : පාලි ව්‍යාකරණය පිළිබඳ කොටස් හතරකින් යුතු ව්‍යුහගත රචනා ප්‍රශ්නයකි.

(ලකුණු 20)

7 ප්‍රශ්නය : ඡන්දෝනිය හා ධර්මාර්ථ විවරණය පිළිබඳ පරීක්ෂා කරන කොටස් හතරකින් යුතු ව්‍යුහගත රචනා ප්‍රශ්නයකි.

(ලකුණු 20)

2 පත්‍රය සඳහා මුළු ලකුණු = 100

අවසාන ලකුණු ගණනය කිරීම : 1 පත්‍රය = 100

2 පත්‍රය = 100

අවසාන ලකුණු = 200÷2=100



CamScanner

Past Papers Wiki

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தரப்) பரீட்சை- 2023(2024)

| විෂය අංකය / பாட இலக்கம் | 74 | විෂයය / பாடம் | පාලි |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 4 | 21. | 2 | 31. | 1 | 41. | 3 |
| 02. | 3 | 12. | 4 | 22. | 1 | 32. | 2 | 42. | 2 |
| 03. | 4 | 13. | 3 | 23. | 2 | 33. | 4 | 43. | 1 |
| 04. | 2 | 14. | 4 | 24. | 3 | 34. | 2 | 44. | 2 |
| 05. | 1 | 15. | 4 | 25. | 3 | 35. | 1 | 45. | 3 |
| 06. | 3 | 16. | 1 | 26. | 3 | 36. | 3 | 46. | 1 |
| 07. | 4 | 17. | 1 | 27. | 2 | 37. | 2 | 47. | 1 |
| 08. | 3 | 18. | 1 | 28. | 2 | 38. | 1 | 48. | 4 |
| 09. | 2 | 19. | 3 | 29. | 3 | 39. | 2 | 49. | 3 |
| 10. | 2 | 20. | 4 | 30. | 2 | 40. | 2 | 50. | 1 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

I කොටස

CamScanner

## 01. ප්‍රශ්නය

(i) සිංහලට නගන්න

සචෙ පිණ්ඩපාතො හොති, සද්ධිවිහාරිකො ච භුඤ්ජිතුකාමො හොති, උදකං දත්වා පිණ්ඩපාතො උපනාමෙතබ්බො. සද්ධිවිහාරිකො පානීයෙන පුච්ඡිතබ්බො. භුත්තාවිස්ස උදකං දත්වා පත්තං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන ධොවිත්වා වොදකං කත්වා මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බො. න ච උණ්හෙ පත්තො නිදහිතබ්බො. පත්තචීවරං නික්ඛිපිතබ්බං. පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං. සද්ධිවිහාරිකම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති, සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ සද්ධිවිහාරිකො නහායිතුකාමො හොති, නහානං පටියාදෙතබ්බං. සචෙ සීතෙන අත්ථො හොති, සීතං පටියාදෙතබ්බං. සචෙ උණ්හෙන අත්ථො හොති, උණ්හං පටියාදෙතබ්බං.

(චුල්ලවග්ගපාළි)

### ආදර්ශ පිළිතුර

ඉදින් පිණ්ඩපාතය වෙයි නම් සද්ධිවිහාරිකයා ද වළඳනු කැමැතේ වෙයි නම් පැන් දී පිණ්ඩපාතය පිරිනැමිය යුතුය. සද්ධිවිහාරිකයා පැනින් විචාළ යුතුය. වළඳා අවසන් වූවහුට පැන් පිළිගන්වා පාත්‍රය පිළිගෙන පහත් කොට කිසිවක නොගටා මනාකොට සෝදා පිසදමා මොහොතක් අව්වෙහි වියලිය යුතුය. පාත්‍රය අව්වෙහි බොහෝ වේලාවක් නොතැබිය යුතුය. පා සිවුරු තැන්පත් කොට තැබිය යුතුය. පාත්‍රය තබන්නා විසින් එක අතකින් පාත්‍රය ගෙන එක අතකින් ඇඳ යට හෝ පුටුව යට හෝ පිසදමා පාත්‍රය තැබිය යුතුය. කිසිවක් නොඅතුරන ලද බිම ද පාත්‍රය නොතැබිය යුතුය. සිවුර තබන්නා විසින් එක අතකින් සිවුර ගෙන එක අතකින් සිවුර දමන උණලීය හෝ සිවුර දමන රැහැන හෝ පිසදමා සිවුර එහා කෙළවර සිට මෙහා කෙළවර දක්වා හකුළා තැබිය යුතුය. සද්ධිවිහාරිකයා නැගීසිටි කල්හි ආසනය හකුළා තැබිය යුතුය. පා සෝදන ජලය පා පුටුව පා උලන ලෑල්ල ද තැන්පත් කොට තැබිය යුතුය. ඉදින් ඒ පෙදෙස කුණුරොඩු සහිත වෙයි නම් ඒ පෙදෙස ඇමදිය යුතුය. ඉදින් සද්ධිවිහාරිකයා නානු කැමති වේයි නම් නාන දිය පිළියෙළ කරදිය යුතුය. ඉදින් සිහිල් ජලයෙන් ප්‍රයෝජන වෙයි නම් සිහිල් ජලය පිළියෙළ කළ යුතුය. ඉදින් උණු ජලයෙන් ප්‍රයෝජන වෙයි නම් උණු ජලය පිළියෙළ කළ යුතුය.

(ii) සිංහලට නගන්න

න අත්තහෙතු න පරස්ස හෙතු, න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං,
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො, ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා.
අප්පකා තෙ මනුස්සෙසු, යෙ ජනා පාරගාමිනො,
අථායං ඉතරා පජා, තීරමෙවානුධාවති.

PAST PAPERS WIKI

යෙ ච ඛො සම්මදක්ඛාතෙ, ධම්මෙ ධම්මානුවත්තිනො,
තෙ ජනා පාරමෙස්සන්ති, මච්චුධෙය්‍යං සුදුත්තරං.

කණ්හං ධම්මං විප්පහාය, සුක්කං භාවෙථ පණ්ඩිතො,
ඔකා අනොකං ආගම්ම, විවෙකෙ යත්ථ දූරමං.

තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය, හිත්වා කාමෙ අකිඤ්චනො,
පරියොදපෙය්‍ය අත්තානං, චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.

(ධම්මපදපාළි)

(ලකුණු 10 + 10 = 20)

## ආදර්ශ පිළිතුර

තමන් නිසා පව් නො කරන්නේය. අනුන් නිසා පව් නො කරන්නේය. පව්කම් කිරීමෙන් පුතෙකු නො කැමති වන්නේය. ධනය නො කැමති වන්නේය. රටක් නො කැමති වන්නේය. අධර්මයෙන් තමාගේ සමෘද්ධිය නො කැමති වන්නේය. මෙසේ එම පුද්ගලයා සිල්වතෙක් ද නුවණැත්තෙක් ද ධාර්මිකයෙක් ද වන්නේය.

මිනිසුන් අතරෙහි යම් ජන කෙනෙක් නිවන් නැමති පරතෙරට යන්නාහු ද ඔවුහු ස්වල්පයකි. තව ද මේ සෙසු ප්‍රජාව මෙතෙරට ම දුවයි.

යමෙක් වනාහි මනාකොට දෙසන ලද ධර්මයෙහි මනාකොට පවතින්නාහු වෙත් ද ඒ ජනයෝ තරණය කිරීමට අපහසු වූ මාරයාගේ විෂය ඉක්ම පරතෙරට පැමිණෙන්නාහ.

නුවණැත්තා අකුසල් දුරුකොට කුසල් වඩන්නේය. යම් විවේකයෙක්හි ඇලීම දුෂ්කර ද ගිහිගෙයින් පැවිද්දට පැමිණ ඒ නිවනෙහි ඇල්ම කැමති වනනේය. නුවණැත්තා කාමයන් හැරදමා පලිබෝධ වූ චිත්තක්ලේශයන්ගෙන් කෙරෙන් තම සිත පිරිසිදු කරන්නේය.

## ලකුණු දීමේ ක්‍රමය

(අ) කොටසට හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි පාඨය සිංහලට නැගීමේදී නිවැරදි අවබෝධය සඳහා ලකුණු **දෙකක්** ද වශයෙන් සලකා ලකුණු ලකුණු **අටක්** ද ව්‍යාකරණානුකූල භාෂා භාවිතය සඳහා ලකුණු **දෙකක්** ද වශයෙන් සලකා ලකුණු පිරිනමන්න. දුෂ්කර පද අතහරිමින් මනඃකල්පිතව කෙරෙන පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

(ආ) කොටසට හිමි ලකුණු සංඛ්‍යාව ද 10කි. එහි නිවැරදි එක් ගාථා පරිවර්තනයකට ලකුණු 02 බැගින් සලකා ලකුණු දීම සුදුසු ය. නිවැරදි අවබෝධය හා ව්‍යාකරණානුකූල බව හා අන්වයට අනුව නොමැති පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

## 02. ප්‍රශ්නය

(i) සිංහලට නගන්න.

තං දිවසඤ්ඤෙව බොධිසත්තොපි තං කාරණං ඤත්වා අජ්ජ මයි මනුස්සපථං ගතෙ මහාජනස්ස බන්ධනා මොක්ඛො භවිස්සතීති ආකාසෙන ගන්ත්වා උය්‍යානෙ ඔතරිත්වා සුවණ්ණපටිමා විය මඞ්ගලසිලාතලෙ නිසීදි. මාණවො බොධිසත්තං උපසඞ්කමිත්වා වන්දිත්වා එකමන්තං නිසීදිත්වා පටිසන්ථාරං අකාසි. බොධිසත්තොපි තෙන සද්ධිං මධුරපටිසන්ථාරං කත්වා කිං නු ඛො මාණව, රාජා ධම්මෙන රජ්ජං කාරෙතීති පුච්ඡි. භන්තෙ, රාජා නාම ධම්මිකො, අපි ච ඛො තං බ්‍රාහ්මණා අනිත්ථෙ පක්ඛන්දාපෙන්ති. රාජා සොළසසුපිනෙ දිස්වා බ්‍රාහ්මණානං ආරොචෙසි. බ්‍රාහ්මණා යඤ්ඤං යජිස්සාමාති ආරද්ධා, කිං නු ඛො භන්තෙ, අයං නාම ඉමෙසං සුපිනානං නිප්ඵත්තීති රාජානං සඤ්ඤාපෙත්වා තුම්හාකං මහාජනං භයා මොචෙතුං න වට්ටතීති? මයං ඛො මාණව, රාජානං න ජානාම, රාජාපි අම්හෙ න ජානාති. සචෙ පන ඉධාගන්ත්වා පුච්ඡෙය්‍ය, කථෙය්‍යාමස්ස මයන්ති. මාණවො අහං භන්තෙ, ආනෙස්සාමි. තුම්හෙ මමාගමනං උදික්ඛන්තා මුහුත්තං නිසීදථාති බොධිසත්තං පටිජානාපෙත්වා රඤ්ඤො සන්තිකං ගන්ත්වා මහාරාජ, එකො ආකාසචාරිකො තාපසො තුම්හාකං උය්‍යානෙ ඔතරිත්වා තුම්හෙහි දිට්ඨසුපිනානං නිප්ඵත්තිං කථෙස්සාමීති තුම්හෙ පක්කොසතීති ආහ.

(ජාතකට්ඨකථා)

## ආදර්ශ පිළිතුර

එදවස ම බෝසත් තෙමේ ද ඒ කරුණ දැන මා මිනිස් පියසට ගිය කල්හි මහජනයාට බන්ධනයෙන් මිදීමක් වන්නේ යැයි අහසින් ගොස් උයනෙහි බැස රන් පිළිමයක් මෙන් මංගල ශිලාතලයෙහි හුන්නේය. මානවකයා බෝසතුන් වෙත එළඹ වැඳ එකත්පසෙක හිඳ පිළිසඳර කළේය. බෝසත් තෙමේ ද ඔහු සමග මිහිරි පිළිසඳර කොට කිමෙක් ද? මානවකය, රජ තෙමේ දැහැමින් රජය කරවයි දැයි විචාළේය. ස්වාමීනි, රජු නම් ධාර්මිකය. එතෙකුදු වුවත් බමුණෝ ඔහු නොමගට ඇද දමති. රජ සොළොස් සිහිනයන් දැක බමුණන්ට දැන්විය. බමුණෝ යාගයක් කරන්නෙමුයි පටන් ගත්තාහ. කිමෙක් ද? ස්වාමීනි, මේ සිහිනයන්ගේ ඵලය මේ යැයි රජුට දන්වා ඔබගේ මහජනයා බියෙන් මුදවීමට නොවටී දැයි (කිය). මානවකය අපි වනාහි රජු නො දනිමු. රජ තෙමේ ද අප නො දනියි. ඉදින් වනාහි මෙහි අවුත් විචාරන්නේ නම් අපි ඔහුට කියන්නෙමු යැයි කීය. මානවකයා, ස්වාමීනි මම ගෙන එන්නෙමි. නුඹ වහන්සේ මගේ පැමිණීම බලමින් මොහොතක් හිඳිනු මැනවැයි බෝසත් හට පිළිණකොට රජුගේ සමීපයට ගොස් මහරජ ආකාසචාරී එක් තාපසයෙක් නුඹ වහන්සේගේ උයනෙහි බැස නුඹ වහන්සේ විසින් දුටු සිහිනවල ප්‍රතිඵලය කියන්නෙමියි නුඹ වහන්සේ කැඳවතියි කීය.

(ii) පාලියට නගන්න.

(අ) භික්ෂූහු තථාගතයන් වහන්සේගේ ධර්මය මනාව ඇසූහ.

(ආ) අපි ගඟ බලමින් ඉවුරේ ඇවිදින්නෙමු.

(ඉ) නුඹලාගේ විහාරයෙහි කුඩා චෛත්‍යයක් තිබේ.

(ඊ) දුටුගැමුණු රජු විසිහතර අවුරුද්දක් රාජ්‍ය කළේය.

(උ) පවුකාරයා පුත්‍රයන් ලවා පක්ෂීන් මරවයි.

## ආදර්ශ පිළිතුරු

(අ) භික්ඛවෙ තථාගතස්ස ධම්මං සාධුකං සුණාථ.

(ආ) මයං තාදිං ඔලොකෙන්තා තීරෙ අභිණ්ඩිස්සාම.

(ඉ) කුම්භකාරං විහාරෙ බුද්ධකචෙතියං අත්ථි.

(ඊ) දුට්ඨගාමණීරාජා චතුවීසතිවස්සානි/චතුවීසතිවස්සං රජ්ජං අකාසි.

(උ) පාපකාරී පුත්තෙහි/පුත්තෙ පක්ඛිකෙ මාරාපෙති.

(ලකුණු 10 + 10 = 20)

## ලකුණු දීමේ ක්‍රමය

(අ) කොටසට හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි පාඨය සිංහලට නැගීමේදී නිවැරදි අවබෝධය සඳහා ලකුණු **අටක්** ද ව්‍යාකරණානුකූල භාෂා භාවිතය සඳහා ලකුණු **දෙකක්** ද වශයෙන් සලකා ලකුණු පිරිනමන්න. දුෂ්කර පද අතහරිමින් මනඃකල්පිතව කෙරෙන පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

(ආ) කොටසට ද හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි නිවැරදි එක් වාක්‍යයකට ලකුණු **දෙක** බැගින් පිරිනමන්න. එක් දෝෂයක් පමණක් ඇති වාක්‍යවලට **ලකුණු එකහමාරක්** ද වැරදි දෙකක් ඇති වාක්‍යවලට **එක් ලකුණක්** ද බැගින් පිරිනමන්න. වැරදි දෙකකට වඩා ඇත්නම් ලකුණු හිමි නොවේ. ~~**දෙවෙනි ක්‍රමය** - වාක්‍යයන්හි වාග්මාලාව සලකා ලකුණු දෙන විට උපරිමය ලකුණු 3කි.~~

## II කොටස

### 03. ප්‍රශ්නය

(i) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා සිගාලකං ගහපතිපුත්තං කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථං අල්ලකෙසං පඤ්ජලිකං පුථුද්දිසා නමස්සන්තං, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසං. දිස්වා සිගාලකං ගහපතිපුත්තං එතදවොච; කින්නුඛො ත්වං ගහපතිපුත්ත කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සසි, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසන්ති? "පිතා මං භන්තෙ කාලං කරොන්තො එවං අවච; 'දිසා තාත නමස්සෙය්‍යාසී'ති. සො ඛො අහං භන්තෙ පිතුවචනං සක්කරොන්තො ගරුකරොන්තො මානෙන්තො පූජෙන්තො කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සාමි, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසන්ති."

(අ) මෙහි කියැවෙන චරිත සංඛ්‍යාව කෙතෙක් ද?

(ආ) බුදුරදුන් හමුවන අවස්ථාවේ සිගාල ගෘහපතියා කෙසේ කුමක් කරමින් සිටියේ දැයි දක්වන්න.

(ඉ) මෙහි සඳහන් පරිදි පියා විසින් දෙන ලද උපදේශයත්, පුත්‍රයා විසින් එය පිළිපැදීමට හේතුවත් පෙන්වා දෙන්න.

(ඊ) ඡේදයෙහි දැක්වෙන සදිසා පිළිබඳ බෞද්ධ අර්ථකථනය කෙටියෙන් ගෙනහැර දක්වන්න.

CamScanner

**ආදර්ශ පිළිතුරු**

(අ) චරිත 3 කි. (බුදුරදුන්, සිගාල ගෘහපතියා හා ඔහුගේ පියා)

(ආ) උදෑසන තෙත් වස්ත්‍ර ඇති ව, තෙත් කෙහෙ ඇතිව, දොහොත් මුදුන තබා ගෙන, වෙන් වෙන්ව සදිසා නමස්කාර කරමින් සිටියේය.

(ඉ) **උපදේශය** - දරුව, සදිසා නමස්කාර කරන්න.
**හේතුව** - පියාගේ වචනයට බුහුමන් කිරීම හා ගරුකිරීම සඳහාය.

(ඊ) බෞද්ධ අර්ථකථනය අනුව සදිසාව ලෙස විස්තර වන්නේ සමාජ යුතුකම් හා වගකීම්ය. ඒ අනුව සදිසාව මෙසේ දැක්වේ.

මාතාපිතා දිසා පුබ්බා - ආචරියා දක්ඛිණා දිසා,
පුත්තදාරා දිසා පච්ඡා - මිත්තාමච්චා ච උත්තරා,
දාසකම්මකරා හෙට්ඨා - උද්ධං සමණබ්‍රාහ්මණා,
එතාදිසා නමස්සෙය්‍ය - අලමත්ථො කුලෙ ගිහී.

'මව්පිය දූදරු සබඳතාව පූර්ව දිසාවය, ගුරු සිසු සබඳතාව දකුණු දිසාවය, අඹුසැමි සබඳතාව බටහිර දිසාවය, මිතුරු දූදරු සබඳතාව උතුරු දිසාවය, ස්වාමි සේවක සබඳතාව යට දිසාවය, ගිහි පැවිදි සබඳතාව උඩ දිසාවය' මෙසේ දිසාවන්ට උපමා කොට ඔවුනොවුන්ගේ යුතුකම් හා වගකීම් විග්‍රහ කොට ඇත.

(ii) නිර්දිෂ්ට ග්‍රන්ථාගත පහත එක් එක් වාක්‍යයේ හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

**(එසාහං, ඨානෙහි, පරම්මරණා, භණමානස්ස, පුරත්ථිමා)**

(අ) සො කායස්සභෙදා ................ සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.
(ආ) න උපජ්ඣායස්ස ................ අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා.
(ඉ) ................ භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි.
(ඊ) කතමෙහි චතුහි ................ පාපකම්මං කරොති?
(උ) සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති, ................ වාතපානා ථකෙතබ්බා.

(ලකුණු 10 + 10 = 20

**ආදර්ශ පිළිතුරු**

(අ) කායස්ස භෙදා **පරම්මරණා** සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.
(ආ) න උපජ්ඣායස්ස **භණමානස්ස** අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා.
(ඉ) **එසාහං** භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි.
(උ) කතමෙහි චතුහි **ඨානෙහි** පාපං කම්මං න කරොති?
(උ) සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති **පුරත්ථිමා** වාතපානා ථකෙතබ්බා.

**ලකුණු දීමේ ක්‍රමය**

(i) කොටසට හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි ප්‍රශ්න හතරේ නිවැරදි පිළිතුරු සඳහා පිළිවෙළින් **ලකු** 1 + 2 + 2 + 5 බැගින් හිමි වේ.

(ii) කොටසේ එක් නිවැරදි පිළිතුරකට **ලකුණු** 2 බැගින් **ලකුණු** 10ක් පිරිනමන්න.

CamScanner

## 04. ප්‍රශ්නය

(i) 'මාගධ භාෂාව ලෝකවාසීන්ගේ මුල් බස ය' යන අට්ඨකථාගත මතයට පක්ෂව හා විපක්ෂව ඉදිරිපත්ව ඇති අදහස් සමාලෝචනය කරන්න.

(ii) පහත වගුවෙහි A කාණ්ඩයේ කරුණුවලට අදාළ ග්‍රන්ථය B කොටසින් තෝරා නිවැරදිව ගලපා නැති වාක්‍යයකින් ප්‍රකාශ කරන්න.

| | A | B |
|---|---|---|
| (අ) | රසවාහිනී නම් පාලි ග්‍රන්ථයට මූලාශ්‍රය වූවකි. | මහාබෝධිවංසය |
| (ආ) | ගාථා 415ක් ඇති පාලි පද්‍යමය කෘතියකි. | සාසනවංසදීපිකාව |
| (ඉ) | සාරත්ථදීපිකා නම් අපර නාමයකින් හැඳින්වෙන්නකි. | සහස්සවත්ථුප්පකරණය |
| (ඊ) | දාඨානාග තෙරුන්ගේ ආරාධනයෙන් කළ ග්‍රන්ථයකි. | දාඨාවංසය |
| (උ) | බුරුම බසින් තිබී පාලියට නගන ලද්දකි. | රසවාහිනීටීකාව |

(iii) බුද්ධ පරිනිර්වාණයේ සිට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම දක්වා ධර්ම - විනය රැකගත් ආචාර්ය පරම්පරා පිළිබඳව කෙටි සමාලෝචනයක් කරන්න.

(iv) පහත දැක්වෙන ග්‍රන්ථයන්ගෙන් දෙකක ඓතිහාසික අගය පෙන්වා දෙන්න.

(අ) මහාවග්ගපාළි (ආ) කථාවත්ථුප්පකරණ

(ඉ) කල්‍යාණිසිලාලිපි (ඊ) මහාකස්සපචරිත

(ලකුණු 5 + 5 + 5 + 5 = 20)

## ආදර්ශ පිළිතුරු

(i) **පක්ෂව ඉදිරිපත්ව ඇති අදහස්.**

- සාම්ප්‍රදායික පිළිගැනීමට අනුව මගධ භාෂාව ලෝකවාසීන්ගේ මුල් බසය.

  සා මාගධී මූලභාසා - නරා යායාදිකප්පිකා,

  බ්‍රහ්මානො චස්සුතාලාපා - සම්බුද්ධා චාපි භාසරෙ.
- විසුද්ධිමග්ගය ඇතුළු අට්ඨකථාගත මතයට අනුව '....සභාවනිරුත්තියා මාගධිකාය සබ්බසත්තානං මූලභාසාය පභෙදගතං ඤාණං .... යනුවෙන් ද මෙම මූලභාසා සංකල්පය දක්වා ඇත.
- 'මේ යථාභූත ආර්ය බ්‍රහ්මව්‍යවහාරය යැයි කියන ලද මාගධ භාෂාව පමණක් වෙනස් නොවේ' යනුවෙන් විභංගට්ඨකථාවෙහි ද අදහසක් දක්නට ලැබේ.
- විනයට්ඨකථාව ඇතුළු අටුවාවන්ට අනුව සකාය නිරුත්ති යනු '.... **එත්ථ සකා නිරුත්ති නාම සම්මාසම්බුද්ධෙන වුත්තප්පකාරො මාගධිකො වොහාරො** ....' යනුවෙන් මගධ බස බව දක්වා ඇත.
- 'යමෙක් කිසිවෙකුගේ වචන නො අසන්නේ නම් ස්වභාව ධර්මයෙන් වචන උපදවන්නේ මගධ භාෂාව ම කථා කරන්නේය. නරකයෙහි තිරිසන් යෝනියෙහි දෙව් ලොව යන හැම තැනම මගධ භාෂාවම උත්සන්නව පවතී' යන මතය විභංග අටුවාවේ දැක්වේ.

**විපක්ෂව ඉදිරිපත්ව ඇති අදහස්.** හඳුන්වාදෙනු කර ගන්නා ක්‍රම ඇති නමුත් ඔවුන් අතර ව්‍යක්ත භාෂාවක්

- කිරිසතුන් අතර අදහස් හුවමාරු කර ගන්නා ක්‍රම ඇති නමුත් ඔවුන් අතර ව්‍යක්ත භාෂාවක් නැති බව.
- මාගධ යන වචනයෙන් එය ප්‍රදේශයකට අයත් බව ඔප්පු වේ. ප්‍රදේශයකට අයත් දේශීය භාෂාවක් පොදු මූල භාෂාවක් විය නොහැකි බව.
- මූල භාෂා සංකල්පය ආගම් පදනම් කරගත් බව පෙනෙයි. ක්‍රිස්තු භක්තිකයෝ බයිබලය ලියා තිබෙන හීබෲ භාෂාව මුල් බස යැයි කියති. මහම්මදිකයෝ අල් කුරාන් පොත ලියා තිබෙන භාෂාව මුල් බස යැයි කීහ. වෛදිකයෝ වේද භාෂාව මුල් බස යැයි කීහ. බෞද්ධයන් මාගධිය මුල් බස යැයි කීමත් එවැන්නකි.

(ii)

(අ) **සහස්සවත්ථුප්පකරණය** රසවාහිනී නම් පාලි ග්‍රන්ථයට මූලාශ්‍රය වූවකි.

(ආ) **දාඨාවංසය** ගාථා 415ක් ඇති පද්‍යමය කෘතියකි.

(ඉ) **රසවාහිනී ටීකාව** සාරත්ථදීපිකා නම් අන්‍ය නාමයකින් හැඳින්වෙන්නකි.

(ඊ) **මහාබෝධිවංසය** දාඨානාග තෙරුන්ගේ ආරාධනයෙන් කළ ග්‍රන්ථයකි.

(උ) **සාසනවංසදීපිකාව** බුරුම බසින් තිබී පාලියට නගන ලද්දකි.

(iii)

- බුද්ධ පරිනිර්වාණයෙන් පසු පළමු ධර්ම සංගීතියේ දී ධර්මය හා විනය රැකගැනීමට ඒ ඒ ආචාර්ය පරම්පරාවන්ට පැවරුණු බව මූලාශ්‍රයන්හි සඳහන්ය. ඒ අනුව විනය පිටකය උපාලි තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ද, දීඝනිකාය ආනන්ද තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ද, මජ්ඣිමනිකාය සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පරම්පරාවට ද, සංයුත්තනිකාය මහාකාශ්‍යප තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ද, අංගුත්තරනිකාය අනුරුද්ධ තෙරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ද, ඛුද්දකනිකාය සෙසු සංගීතිකාරක තෙරවරුන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවලට ද පවරා ඇත. අභිධර්ම පිටකය ද ඛුද්දක නිකායෙහි ම ඇතුළත් කළ බව අටුවාවන්හි විස්තර වේ.
- විනය පිටකයේ ආචාර්ය පරම්පරා නාම ලේඛනයක් මූලාශ්‍රයන්හි දක්නට ලැබුණ ද සෙසු ධර්ම ග්‍රන්ථයන් රැක ගත් පරම්පරාවන් පිළිබඳ නාම ලේඛන දැකිය නො හැකිය.
- ථෙරවාදී ත්‍රිපිටකය හා අර්ථකථන ක්‍රමය තෙවන ධර්ම සංගීතියෙන් පසු මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලක්දිවට ගෙනෙන ලදුව මෙරට මහාවිහාරීය භික්ෂූන් විසින් එය භාණක පරපුරෙන් රැකගෙන ආවේය.
- බැමිණිතියා සාගතය සමයෙහි අප්‍රතිහත ධෛර්යයෙන් රැකගත් ධර්ම විනය බුද්ධවර්ෂ 440දී මාතලේ අලුවිහාරයේ දී පුස්තකාරූඪ කළේය.

(iv)

(අ) **මහාවග්ගපාළිය** විනය පිටකයේ තුන්වන ග්‍රන්ථයයි. මෙහි ඛන්ධක 10ක් ඇතුළත්ය. බුද්ධශාසනයේ ආරම්භය හා ක්‍රමයෙන් විකාසය වීමේ ඓතිහාසික වාර්තාව මහාවග්ගපාළිය ලෙස හැඳින්වීම නිවැරදිය. ඒ බව එහි අන්තර්ගතය පිරික්සීමෙන් ප්‍රකට වෙයි. මහක්ඛන්ධකයේ බුද්ධත්වය ලැබූ තැන් පටන් බුද්ධචරිතය, පැවිදි-උපසම්පදා කිරීම හා ආරාම පිළිගැනීම ආදි විස්තර ඇතුළත්ය. උපෝසථක්ඛන්ධකය, වස්සූපනායිකක්ඛන්ධකය, පවාරණක්ඛන්ධකය, චම්මක්ඛන්ධකය, භෙසජ්ජක්ඛන්ධකය, කඨිනක්ඛන්ධකය, චීවරක්ඛන්ධකය, චම්පෙය්‍යක්ඛන්ධකය හා කොසම්බක්ඛන්ධකය යන ඛන්ධකයන්හි අනුක්‍රමයෙන් ශාසනයේ සිදුවූ පරිණාමීය ලක්ෂණ විස්තර වේ.



CamScanner

(ඈ) **කථාවත්ථුප්පකරණය** තෙවැනි සංගීතියෙන් පසු මොග්ගලිපුත්තතිස්ස මහරහතන් වහන්සේ විසින් සම්පාදනය කොට අභිධර්ම පිටකයට ඇතුළත් කරන ලද්දකි. බුද්ධ පරිනිර්වාණයෙන් පසු ඒ ඒ කාලවකවානුවලදී ශාසනයේ ඇතිවූ මතභේදයන් නිරවුල් කිරීම සඳහා සම්පාදිත ග්‍රන්ථයකි. පරවාද පක්ෂියයන් ඛණ්ඩනය කොට සකවාද පක්ෂියයන් උද්දීපනය කිරීම සඳහා මෙය සකසා ඇති බව පිළිගැනේ. වජ්ජිපුත්තකාදී අන්‍ය නිකායික භික්ෂූන් විසින් උපදවන ලද පුද්ගලවාදය ඛණ්ඩනය කිරීම මෙහි මූලික අරමුණ බව පෙනෙයි. මෙහි වාදකථා 217ක් වෙයි.

(ඉ) **කල්‍යාණිසිලාලිපි** වනාහි රාමඤ්ඤ දේශාධිපති ධම්මචේතිය මහරජු විසින් පිහිටුවන ලද පාලි සෙල්ලිපියකි. මුද්‍රිත පිටු 43කි. විශාල ගල්ලැලි 3ක කොටන ලද්දකි. කෝට්ටේ යුගයේ විදාගම මාහිමියන් ප්‍රමුඛ සංඝයාගෙන් උපසම්පදාව ලත් එරට සඟ පිරිස් එහි ගොස් හංසවතී නුවර සීමා බැඳ එය කල්‍යාණි සීමා ලෙස නම් කළ බව කියැවේ. මෙහි ලංකා සාසනය වරින් වර ශුද්ධ කළ සැටිත් උත්තරජීව හා ඡප්පට යන තෙරවරුන් ලක්දිවට පැමිණි බවත් ඔවුන් නැවත ගොස් සිංහල භික්ෂුවංශයක් පිහිට වූ ආකාරයත් ධම්මචේතිය රජු මොග්ගල්ලාන තෙරුන් ප්‍රමුඛ දෙවිසි නමකුත් මහාසීව තෙරුන් ප්‍රමුඛ දෙවිසි නමකුත් ලක්දිවට එවා උපසම්පදා කරවූ බවත් සඳහන් වේ.

(ඊ) **මහාකස්සප චරිතය** විදුරුපොල පියතිස්ස නාහිමින්ගේ කෘතියකි. ගාථා 1500කි. සර්ග 20කි. මහාකස්සප තෙරුන්ගේ චරිතය මහාකාව්‍යයකට නැගීමකි. මුල් සර්ග 13න් බුදුසිරිත ද අනෙක් සර්ගවලින් මහාකාශ්‍යප තෙරුන්ගේ චරිතය ද කියැවෙන මෙය උසස් පාලි මහාකාව්‍යයකි. බුදුසිරිත හා මහාකාශ්‍යප තෙරුන් පිළිබඳ ඓතිහාසික කරුණු ද ඇතුළත්ය.

## ලකුණු දීමේ ක්‍රමය

(i) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති කරුණුවලින් පක්ෂ හා විපක්ෂ කරුණු තුනක්වත් සමාලෝචනය කර ඇත්නම් **ලකුණු 05ක්** පිරිනමන්න.

(ii) එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් **ලකුණු 5ක්** හිමි වේ.

(iii) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති කරුණුවලට අනුව පිළිතුරු සපයා ඇත්නම් **ලකුණු 05ක්** පිරිනමන්න.

(iv) ආදර්ශ පිළිතුරේ දී ඇති කරුණු ආවරණය වන පරිදි කරනු ලබන එක් පැහැදිලි කිරීමකට ලකුණු දෙක හමාර බැගින් **ලකුණු 05ක්** පිරිනමන්න.

## 05. ප්‍රශ්නය

(i) පහත වගුවෙහි A කොටසේ දැක්වෙන කාව්‍ය ලක්ෂණ ප්‍රකාශ වන පාලි පාඨයක් B කොටසින් තෝරා ලියන්න.

| | A | B |
|---|---|---|
| (අ) | රූපකාලංකාර දෙකකි. | නානා ච නානා වණ්ණා ච සජ්වා විය දිස්සරෙ |
| (ආ) | ධර්මරසය දනවන්නකි. | මුත්තා සමුද්දා උග්ගන්ත්වා තීරෙ වට්ටි වියට්ඨිතා |
| (ඉ) | ශබ්දරසය උපදවන්නකි. | සත්තවෙසො ගුණනිධි කරුණාමතිසාගරො |
| (ඊ) | අවස්ථා නිරූපණයකි. | නෙතා විනෙතා අනුනෙතා තාදිසො ලභතෙ යසං |
| (උ) | ස්වභාවෝක්තියකි. | නිහීනසෙවී න ච වුද්ධසෙවී නිහීයරෙ කාලපක්ඛෙව චන්දො |



CamScanner

(ii) මහාසුපින ජාතකයෙහි සඳහන් පහත දැක්වෙන සිහින අර්ථවත්වීමට අදාළ පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(කුම්භියා, දීපිනො, චන්දනසාරං, පොක්ඛරණිං, උදකෙ)

(අ) එකං පඤ්චපදුමසඤ්ඡන්නං ගම්භීරං සබ්බතොතිත්ථං .................. අද්දසං.

(ආ) එකිස්සායෙව .................. පච්චමානං ඔදනං අපාකං අද්දසං.

(ඉ) සතසහස්සග්ඝණකං .................. පූතිතක්කෙන වික්කිණන්තෙ අද්දසං.

(ඊ) තුච්ඡලාපූනි .................. සීදන්තානි අද්දසං.

(උ) ඵළකෙ .................. අනුබන්ධිත්වා මුරුමුරුති ඛාදන්තෙ අද්දසං.

(iii) මහාවංසයේ නිර්දිෂ්ට කොටස ඇසුරෙන් අරිට්ඨ අමාත්‍යයා ප්‍රමුඛ ශ්‍රී ලාංකික දූත පිරිසේ භාරත දූත මෙහෙවර අගයන්න.

(iv) වත් පිළිවෙත් ඉටුකිරීම ශීලයට අදාළ වන ආකාරය වත්තක්ඛන්ධකයේ නිර්දිෂ්ට කොටස ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 5 + 5 + 5 + 5 = 20)

## ආදර්ශ පිළිතුර

(i)

| | A | B |
|---|---|---|
| (අ) | රූපකාලංකාර දෙකකි. | සන්තවෙසො ගුණනිධි කරුණාමතිසාගරො |
| (ආ) | ධර්මරසය දනවන්නකි. | තිහිතසෙවී න ච වුද්ධසෙවී තිහියරෙ කාලපක්ඛෙව චන්දො |
| (ඉ) | ශබ්දරසය උපදවන්නකි. | නෙතා විනෙතා අනුනෙතා තාදිසො ලභතෙ යසං |
| (ඊ) | අවස්ථා නිරූපණයකි. | මුත්තා සමුද්දා උග්ගන්ත්වා තීරෙ වට්ටි වියට්ඨිතා |
| (උ) | ස්වභාවෝක්තියකි. | නානා ච නානා වණ්ණා ච සජීවා විය දිස්සරෙ |

(ii)

(අ) එකං පඤ්චපදුමසඤ්ඡන්නං සබ්බතො තිත්ථං **පොක්ඛරණිං** අද්දසං.

(ආ) එකිස්සායෙව **කුම්භියා** පච්චමානං ඔදනං අපාකං අද්දසං.

(ඉ) සතසහස්සග්ඝනකං **චන්දනසාරං** පූතිතක්කෙන වික්කිණන්තෙ අද්දසං.

(ඊ) තුච්ඡලාපූනි **උදකෙ** සීදන්තානි අද්දසං.

(උ) ඵළකෙ **දීපිනො** අනුබන්ධිත්වා මුරුමුරුති ඛාදන්තෙ අද්දසං.

(iii)

අරිට්ඨ කුමාරයා ඇතුළු රාජකීය දූත පිරසක් තිස්ස කුමරු රජවීමත් සමග භාරතයට යැවිණ. ලක්දිව තිබූ වටිනා සම්පත් රාශියක් ද අශෝකාධිරාජයාට ඒ සමග යැවිණ. මෙයින් තුටු වූ රජතුමා දූත පිරිසට සංග්‍රහ කළ අතර තිස්ස රජුට ද මහත් වටිනා පිළි-පඬුරු එව්වේය. මෙම තානාපති ගනුදෙනුව ලක් ඉතිහාසය වෙනස් වීමට හේතු විය. රජදරුවන්ගේ අභිෂේක ක්‍රමය වෙනස් විය. ආගමික සම්ප්‍රදාය වෙනස් විය. අධ්‍යාපන ක්‍රමය වෙනස් විය. මෙසේ මෙම දූත මෙහෙවර ලක්දිව දේශපාලනික, ආගමික හා සංස්කෘතික පරිවර්තනයක් සිදු වූවක් ලෙස හඳුන්වා දීමට හැකිය.

CamScanner

(iv)
- 'වත් නොපුරන්නා සිල් නොපුරයි' යන කියමනට අනුව ශාසනික වත් වනාහි අත්‍යන්තයෙන් ම භික්ෂුවගේ සීලය හා බැඳී පවතී.
- ආචරිය හා අන්තෙවාසික වත් දක්වා ඇති නිර්දිෂ්ට කොටස තුළ එම ශාසනික භූමිකාවන්ට අදාළ වත් දක්වා ඇත.
- තම තමන්ගේ ශාසනික යුතුකම් හා වගකීම් හැඳින ඒවා ඉටුකිරීමට අසමත් තැනැත්තාගෙන් කායික-මානසික ශික්ෂණයට උපකාරී වන ශීලයක් බලාපොරොත්තු වීම උගහටය.
- වත් තුළ සඳහන් වන්නේ එදිනෙදා භික්ෂුවගේ ජීවන චර්යාව හා පැවැත්ම සම්බන්ධ කරුණු දුටුවන් පහදවන ආකාරය හා සෞම්‍ය සම්පන්නව ඉටු කරගන්නා ආකාරයයි.
- වත් මෙන්ම සිල් නොපුරන්නා අන්‍යයන්ගේ ගර්හාවට පත් වන අතර වත් හා සිල් පිරීම නොපැහැදුනවුන් පහදීමටත් පැහැදුනවුන්ගේ පැහැදීම වැඩි වීමටත් හේතු වේ.

## ලකුණු දීමේ ක්‍රමය

(i) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති නිවැරදි එක් පිළිතුරකට එක ලකුණ බැගින් **ලකුණු** 05 පිරිනමන්න.

(ii) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති ආකාරයට නිවැරදිව පද යොදා ඇත්නම් නිවැරදි පිළිතුරකට එක් ලකුණ බැගින් **ලකුණු** 05 පිරිනමන්න.

(iii) ආදර්ශ පිළිතුරේ දී ඇති කරුණු ආවරණය වන පරිදි පිළිතුරු සපයා ඇත්නම් **ලකුණු** 05ක් ප්‍රදානය කරන්න.

(iv) ආදර්ශ පිළිතුරේ දී ඇති කරුණු ආවරණය වන පරිදි පිළිතුරු සපයා ඇත්නම් **ලකුණු** 05ක් ප්‍රදානය කරන්න.

## III කොටස

### 6. ප්‍රශ්නය

(i) පහත දී ඇති ගාථාවෙහි තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණානුකූල අර්ථ පෙන්වා දෙන්න.

**තාසු** එකා **ලතායට්ඨි,** **රජතාභා** **තහිං** **ලතා,**
**සුවණ්ණවණ්ණා** රුචිරා, **දිස්සන්තෙ** තා මනොරමා.

(ii) පහත සඳහන් යෙදුම් පාලියෙන් ලියන්න.

(අ) පුරුෂයෝ සිවු දෙනෙක්
(ආ) පස්වැනි රජතුමා
(ඉ) සිහින සොළොසක්
(ඊ) ලක්ෂයක් වටිනා
(උ) අනෙක් මිනිස්සු
(ඌ) සත් දිනක්
(එ) ආයුෂ්මත් ආනන්ද
(ඒ) කොහි ගියාහු ද?
(ඔ) එක් රාත්‍රියක
(ඕ) දේවියගේ අතෙහි

Past Papers Wiki
PAST PAPERS WIKI
CamScanner

**(iii)** (අ) අජ්ජතනී පරස්සපද විභත්ති ප්‍රත්‍යයමාලාව ගෙනහැර දක්වන්න.

(ආ) 'චර' ධාතුව සත්තමී ආඛ්‍යාත පරස්සපදයෙහි වරනගන්න.

**(iv)** පහත දක්වෙන ව්‍යාකරණාංග නිර්වචනය කරන්න.

(අ) අත්තනොපද (ආ) අතීත කිතක

(ඉ) අව්‍යය පද (ඊ) ආඛ්‍යාත

(උ) තුමන්ත ක්‍රියා

(ලකුණු 5 + 5 + 5 + 5 = 2

ආදර්ශ පිළිතුරු

(i)

**තාසු** - ඒවා අතුරෙන්/ඒවායින්

**ලතායට්ඨී** - ලතා යෂ්ටියකි

**තහිං** - එහි

**සුවණ්ණවණ්ණා** - ස්වර්ණ වර්ණ නැතහොත් රන්වන් වූ

**දිස්සන්තෙ** - දක්නා ලැබෙත්

(ii)

(අ) චත්තාරො පුරිසා

(ආ) පඤ්චමො රාජා

(ඉ) සොළස සුපිනා/සුපිනෙ

(ඊ) සතසහස්සග්ඝණිකං

(උ) ඉතරා පජා/ඉතරෙ මනුස්සා

(ඌ) සත්තාහං

(එ) ආයස්මා ආනන්දො

(ඒ) කුහිං ගතා/කුහිං ගච්ඡිත්ථ

(ඔ) එකායං රත්තියං/එකාය රත්තියා

(ඕ) දෙවියා හත්ථෙ

(iii)

(අ) **අජ්ජතනී** ඊ, උං, ඔ, ත්ථ, ඉං, ම්හා

(ආ)

| පුරිස | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමපුරිස | චරෙ/ චරෙය්‍ය | චරෙය්‍යුං |
| මජ්ඣිමපුරිස | චරෙය්‍යාසි | චරෙය්‍යාථ |
| උත්තමපුරිස | චරෙය්‍යාමි | චරෙය්‍යාම |

(iv)

(අ) **අත්තනො පද** යනු ක්‍රියාවෙහි ඵලය තමන් වෙත පැමිණෙන ආඛ්‍යාත පදයයි.

(ආ) 'ත, තවන්තු, තාවී' යන ප්‍රත්‍යය එක්වීමෙන් සෑදෙන කිතක පද **අතීත කිතක** පදයි.

(ඉ) වරනොනැගෙන නිපාත හා උපසර්ග **අව්‍ය** පදයි.

(ඊ) **ආඛ්‍යාත** යනු ධාතු කෙරෙන් පරව ප්‍රත්‍යය යොදා සාදාගනු ලබන ක්‍රියා සිද්ධියක් ප්‍රක
වන පද විශේෂයකි.

(උ) තුමන්ත ක්‍රියා 'යන්ට', 'කරන්ට' යනාදී අර්ථ ලබාගැනීම සඳහා ධාතුව අගට 'තුං, ත
තායෙ' යන ප්‍රත්‍යය යොදා සාදාගන්නා පද විශේෂයකි.

ලකුණු දීමේ ක්‍රමය

(i) නිවැරදි එක් පිළිතුරකට එක ලකුණ බැගින් **ලකුණු** 05 පිරිනමන්න.
(ii) එක් නිවැරදි පිළිතුරකට **ලකුණු භාගය** බැගින් **ලකුණු** 05 පිරිනමන්න.
(iii) (අ) කොටසට ලකුණු දෙකක් ද (ආ) කොටසට ලකුණු තුනක් ද පිරිනමන්න.
(iv) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති ආකාරයට නිවැරදි එක් නිර්වචනයකට එක ලකුණ බැගින් සලකා **ලකුණු** 05 පිරිනමන්න.

## 7. ප්‍රශ්නය

(i) පහත දැක්වෙන වචනවලට **විරුද්ධාර්ථවත්** පද එක බැගින් ලියන්න.

| | |
|---|---|
| (අ) අනොකං | (ඌ) දුගන්ධං |
| (ආ) අනුත්තමො | (එ) නින්දා |
| (ඉ) උදයං | (ඒ) පාරතො |
| (ඊ) නිම්මුග්ගො | (ඔ) සන්තිකං |
| (උ) දුග්ගතිං | (ඕ) සුභාවිතං |

(ii) පහත ගාථාවෙන් ප්‍රකාශ වන ධර්ම **කරුණු දෙකක්** පිළිබඳ කෙටි විවරණයක් කරන්න.

පටිසම්භිදා චතස්සො ච, විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා, කතං බුද්ධස්ස සාසනං.

(iii) මහාසුපින ජාතකාගත සිහින පිළිබඳ විවරණයෙහි සර්වකාලීන අගය නිදසුන් පහක්වත් ඇසුරෙන් අනාවරණය කරන්න.

(iv) ධම්මපදයේ පණ්ඩිත වග්ගයෙන් අනාවරණය කෙරෙන පණ්ඩිත ලක්ෂණ දහයක් ගෙනහැර දක්වන්න.

(ලකුණු 5 + 5 + 5 + 5 - 20)

### ආදර්ශ පිළිතුරු

(i)

| | |
|---|---|
| (අ) අනොකං - ඔකං | (ආ) අනුත්තමො - උත්තමො, අධමො |
| (ඉ) උදයං - වයං | (ඊ) නිමුග්ගො - උම්මුග්ගො |
| (උ) දුග්ගතිං - සුගතිං | (ඌ) දුගන්ධං - සුගන්ධං |
| (එ) නින්දා - පසංසා | (ඒ) පාරතො - ඔරතො |
| (ඔ) සන්තිකං - දූරං | (ඕ) සුභාවිතං - අභාවිතං |

(ii)

**චතස්සො පටිසම්භිදා** - එනම් **අත්ථ, ධම්ම, නිරුත්ති, පටිභාන** යන සිව්පිළිසිඹියාවන්ය. රහතන් වහන්සේලා කොටස් දෙකකි. එනම් සුක්ඛවිපස්සක හා චතුපටිසම්භිදාප්පත්ත යනුවෙනි. අර්හත්වය පසක් කිරීමේදී පිළිසිඹියා පත් රහතන් වහන්සේ උසස් වෙති.

**ඡළභිඤ්ඤා** - මෙම ධර්මපදයෙන් අධිමානුෂික ඥාන හයක් විස්තර වෙයි. එනම්, ඉද්ධිවිධ ඤාණය, දිබ්බසොත ඤාණය, චෙතොපරිය ඤාණය, දිබ්බචක්ඛු ඤාණය, පුබ්බෙනිවාසානුස්සති ඤාණය, ආසවක්ඛය ඤාණය වශයෙනි.

**අට්ඨවිමොක්ඛා** - මෙම ගාථාව යෙදී ඇති අපදානපාළියට අනුව මාර්ග ඤාණ හතර සහ ඵල ඤාණ හතර අට්ඨවිමොක්ඛ යන්නෙන් අදහස් වේ. (**විමොක්ඛාපි ච අට්ඨිමෙති චත්තාරි මග්ගඤාණානි චත්තාරි ඵලඤාණානීති ඉමෙ අට්ඨ විමොක්ඛා සංසාරතො මුච්චනූපායා සච්ඡිකතාති සම්බන්ධො**) එහෙත් අංගුත්තරනිකාය අට්ඨක නිපාතයේ විමොක්ඛ සූත්‍රයට හා

CamScanner

අභිධර්මයට අනුව අටවිමොක්ඛ යනුවෙන් දැක්වෙන්නේ 'රූපවත් වූයේ රූපය දකියි, ආධ්‍යාත්මික අරූපසංඥී වූයේ බාහිර රූප දකියි, සුභ කසිණයන් අරමුණු කොට වසයි, අකාසානඤ්චායතන සමාපත්තියට සමවැද වසයි. විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට සමවැද වසයි. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට සමවැද වසයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට සමවැද වසයි' යන කරුණු අටයි.

(iii)

- කළු ගොනුන් සතර දෙනෙක් යුද්ධකිරීමට පැමිණ යුද්ධ නොකර පළා යාම (අධාර්මික රජවරුන්ගේ රාජ්‍යයන්හි කලට වැසි නොලැබීමෙන් භෝග විනාශ වීම)
- කුඩා ගස් පල දැරීම (වැඩිවිය නොපත් දැරියන් පතිකුලයට යාම)
- එදිනම උපන් වසුපැටවුන්ගේ කිරි දෙනුන් විසින් බීම (වැඩිහිටියන් නොසලකා හැරීම)
- ශක්තිමත් ගොනුන් සිටියදී දුර්වල වස්සන් ගැලෙහි යෙදීම (සුදුස්සාට නිසි තැන නොදීම)
- දෙපස මුව ඇති අශ්වයෙක් කටවල් දෙකින්ම ආහාර ගැනීම (පාලකයන් හා විනිශ්චයකරුවන් චූදිත චෝදක දෙපාර්ශ්වයෙන් ම අල්ලස් ගැනීම)
- රන් පාත්‍රයට මහලු සිවලෙක් මුත්‍රා කිරීම (කුල හීනයන් කුලවමියන් ආවාහ කරගැනීම)
- මහලු සිවලිය අඹරන රැහැන ගිල දැමීම (කුලස්ත්‍රීන් අසද්ධර්මයට යොමු වීම)
- ජනයා රැස් වී පිරුණු කළයම පිරවීම (ජනතාව තම උපයන සියලු වස්තුව පාලකයන්ගේ සුඛ විහරණය සඳහා ම යෙදවීම)
- මැද කැළඹුණු විලක් දැකීම (රජවරු අගතිගාමී වී ජනතාව පෙළා බදු උපයා ගැනීම)
- එකම සැළියෙහි තුන් ආකාර බතක් පැසීම (අධාර්මික රජවරුන්ගේ රාජ්‍යවල ස්වභාවික විපත් ඇතිවීම)
- සඳුන් අරටුවක් කුණුමෝරුවලට විකිණීම (භික්ෂූන් මුදලට ධර්මය දෙසීම)
- හිස් ලබු කබල් දියේ ගිලීම (රජයේ ප්‍රධාන තනතුරුවලට මෝඩ නිවටයන් පත්වීම)
- මහා කලුගල් ජලයේ පාවීම (උගත් කුලවත් අයගේ වචන නොසලකා හැරීම)
- ගෙම්බන් විසින් සර්පයන් කා දැමීම (පාලකයන්ගේ මැරයන් විසින් පරම්පරාගත උරුමකරුවන්ගේ ඉඩකඩම් පැහැර ගැනීම)
- හංසයන් විසින් කපුටෙකු පිරිවරාගෙන සිටීම (කුලවතුන් උගතුන් එකතුවී මෝඩ පුද්ගලයෙකු පාලකයා කර ගැනීම)
- එළුවන් විසින් දිවියන් කා දැමීම (පාලකයන්ගේ මැරයන් විසින් කුලවතුන්ගේ වස්තුව බලයෙන් අල්ලා ගැනීම හා දුස්සීල භික්ෂූන් ශාසනික දේපල බලයෙන් අල්ලා ගැනීම)

(iv)

- වරද පෙන්වා දී එයට දෝෂාරෝපණය කොට වරදින් මුදවා ගන්නා කලණ මිතුරන් ඇසුරු කිරීම (නිග්ගය්හවාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ)
- තම මිතුරන් වැරදි අසභ්‍ය දේවලින් වළක්වා ගැනීම (ඕවදෙය්‍යානුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ)
- ධර්මානුකූල ජීවිතය හා පිරිසිදු සිතින් යුක්ත වීම (ධම්මපීති සුඛං සෙති විප්පසන්නෙන චෙතසා)
- සිත දමනය කරගෙන ජීවත්වීම (අත්තානං දමයන්ති පණ්ඩිතා)

PAST PAPERS WIKI
Past Papers Wiki
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

- නින්දා ප්‍රසංසාදියෙහි දී උපේක්ෂා සහගත වීම (නින්දා පසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා)
- සැපයේ දී උද්දාමයට පත්වීමත් දුකේ දී කණගාටු වීමත් නැතිව උපේක්ෂාවෙන් විසීම (සුඛෙන ඵුට්ඨා අථවා දුඛෙන නොච්චාවචං පණ්ඩිතා දස්සයන්ති)
- කිසිම හේතුවක් නිසා පණ්ඩිතයා අධාර්මික ක්‍රියාවලින් සමෘද්ධියක් අපේක්ෂා නොකිරීම ( න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො)
- සමාජයේ යහමග යන අය විරල බව තේරුම් ගෙන වාසය කිරීම (අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො)
- කිලිටි අකුසල ධර්ම බැහැර කොට කුසල් දහම් වැඩීම (කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො)
- නිවන අරමුණුකොට කටයුතු කිරීම

**ලකුණු දීමේ ක්‍රමය**

(i) එක් නිවැරදි පිළිතුරකට **ලකුණු** භාගය බැගින් **ලකුණු** 05 පිරිනමන්න.

(ii) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති ආකාරයට එක් නිවැරදි පැහැදිලි කිරීමකට **ලකුණු** දෙක හමාර බැගින් සලකා **ලකුණු** 05 පිරිනමන්න.

(iii) ආදර්ශ පිළිතුරෙහි දී ඇති කරුණුවලින් නිදසුන් පහක් ඇසුරෙන් ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් **ලකුණු** 05 පිරිනමන්න.

(iv) පණ්ඩිත වර්ගයේ එන පණ්ඩිත ලක්ෂණ දහයක් ලියා ඇත්නම් එක් කරුණකට **ලකුණු** භාගය බැගින් සලකා **ලකුණු** 05 පිරිනමන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library
CamScanner